**සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ ගනුදෙනු පිළිබඳව වාර්තාව - 2022 හා 2023**

-----------------------------------------------------------------------------------------------

සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයන්හි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණන කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දිමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2022 සහ 2023 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම<br>රු. |
|---|---|
| <u>වත්කම්</u> | |
| මුළු වත්කම් | 1,258,482,698 |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 1,257,296,648 |
| <u>වගකීම්</u> | |

| | |
|---|---|
| මුළු බැරකම් | 1,186,050 |
| මුළු ස්කන්ධය හා බැරකම් | 1,258,482,698 |
| මුළු ආදායම | 1,678,118 |
| මුළු වියදම | 3,902,211 |
| අතිරික්තය / ( ඌණතාවය) | (2,224,093) |

## 03. සමාගම ඇවර කිරීම

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් රු. මිලියන 200 ක (සාමාන්‍ය කොටස් 20,000,007ක) මූලික ආයෝජනයකින් සි/ස නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම 2003 ජූනි මස 23 වන දින සීමාසහිත පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණි. අරමුදල විසින් මෙම සමාගම සමඟ 2003 නොවැම්බර් 18 දින එළඹි ගිවිසුමට අනුව අරමුදල සතු රු.මිලියන 3,160.7 ක් වූ අරමුදල් කළඹ කළමනාකරණය කිරීම මෙම සමාගමට පවරා තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට අරමුදල විසින් සමාගමෙහි කොටස් 98,550,007 ක රු.985,500,070 ක් ආයෝජනය කර තිබුණි.<br><br>සමාගම 2017 වසරේ සිට සුරැකුම්පත් ගනුදෙනු තුළින් සැලකිය යුතු අලාභ ලබා තිබුණි. මේ හේතුවෙන්, 2018 අගෝස්තු 28 වන දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාගම ඇවර කිරීම මහ බැංකුවේ අනුමැතියට යටත්ව සිදුකළ යුතු බවට තීරණය කර තිබූ අතර 2021 මාර්තු 02 දිනැති අංක අමප /21/0269/313/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එය තහවුරු කර තිබුණි. එසේ වුවද 2024 අගෝස්තු 31 දින වන විටත් ඇවරකරුවෙකු පත්කර හෝ ඇවර කිරීමේ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. | සමාගම විසින් මූල්‍ය අවභාවිතය සම්බන්ධ නඩු 2 ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති බැවින් එම නඩු අවසන් වන තෙක් සමාගම් ඇවර කිරීම ප්‍රමාද වී ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**04. ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ 2023 වර්ෂයට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ, බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම් ප්‍රකාශන, මුදල් පොත්, ගෙවීම් වවුචර්, ලදුපත්, ආයෝජන පිළිබඳ විස්තර සහ අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා, ගණකාධිකාරී සමාගමක් වන අමරසේකර සහ සමාගම විසින් සිදු කරන අතර සියලුම වාර්තා එම ගණකාධිකාරී සමාගමේ ඇති අතර එම සමාගම වෙත ගොස් අදාල පරීක්ෂාවන් සිදු කල හැකිවේ. | ආයතනයේ කළමනාකරණය වගකීම් විරහිතව කටයුතු කර ඇතිබව නිරීක්ෂණය වේ. මූල්‍ය වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණය සතු වේ. ගිණුම් සකස් කිරීම සඳහා ගණකාධිකාරී ආයතනයක සහය ලබා ගැනීම ආයතනයේ අභ්‍යන්තර කාර්යයකි. අදාල මූල්‍ය වාර්තා නිසි පරිදි සකස්කර ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණයට විරුද්ධව කටයුතු කළ යුතුය. |